Article 12(1)

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date.

2016-3-01

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

පැමිණිලිකරු : එම්.ජී සරත් මයා.
අංක 79/58 ඒ දොඩම්වල පටුමග.
අස්ගිරිය. මහනුවර.

වගඋත්තරකරුවන් : නියෝජ්‍ය නාගරික කොමසාරිස්.
මහනගර සභාව.
මහනුවර.

පැමිණිලි අංකය : **HRC/K/191/17**

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තමා සැලසුම් අංක බීඒ/51/2013 හා බලපත්‍ර අංක 238 යටතේ තමාට අයත් ඉඩමෙහි මායිම් බැමි හා ගේට්ටු ඉදිකිරීම සඳහා අයදුම් කර ඒ සඳහා අනුමැතිය 2014.05.30 දින ලබා ගත් බවත් එකී අනුමත කාල සීමාවේදී අදාළ ඉදිකිරීම් නිමකර ගැනීමට නොහැකි වූ බැවින් නැවත 2016.05.30 වන දින දක්වා අනුමත කරගත් බවත්ය.

ඒ අනුව අදාළ ඉදිකිරීම් සිදුකරගෙන යන අවස්ථාවේදී ද්වේශ සහගතව පොලිස් හදිසි ඇමතුම් අංකයට කරන ලද පැමිණිල්ලක් අනුව අදාළ ඉදිකිරීම් නවත්වන ලෙස මහනුවර පොලිසිය විසින් තමාට දැන්වූ බවත්. ඒ අතරතුර කාලය තුළ අනුමත කාල සීමාව 2016.05.30 දින අවසන් වන බැවින් තවත් වසරකින් එකී කාලය දීර්ඝ කරදෙන ලෙස සැලසුම් අංශයේ නිලධාරීන්ට තමා ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් යොමුකළ බවත් ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලද හෙයින් තමාගේ නීතිඥ මහතා විසින් නියෝජ්‍ය නාගරික කොමසාරිස්තුමිය වෙත කරුණු පැහැදිලි කර දුන් නමුත් අදාළ කාල සීමා දීර්ඝය ලබා නොදුන් බවත් මේ සම්බන්ධයෙන් කිහිප විටක්ම අදාළ බලධාරීන් හමු වී සාකච්ඡා කළ බවත් පසුව නාගරික කොමසාරිස්තුමිය 2017.01.26 දින අදාළ බලපත්‍රයේ වලංගු කාලය 2014.05.30 දින සිට 2017.05.30 දින දක්වා ආපස්සට ගනිමින් 2017.01.26 දින දීර්ඝ කරදුන් බවත් සඳහන් කර ඇත.


ප්‍රධාන කාර්යාලය :- අංක 165, කින්සි පාර, කොළඹ - 08.
தலைமைக் காரியாலயம் :- இல 165, கின்சி வீதி, கொழும்பு - 08.
*Head Office* :- No 165, Kynsey Road, Colombo - 08.

*Tele :* +94 -11- 2694925, 2685980, 2685981
***Chairman :*** 2696470
***Secretary :*** 2689558
***Hotline :*** 2689064

***Fax*** : +94 11 2694924
***E-Mail*** : *sechrc@sltnet.lk*
***Web*** : *www.hrcsl.lk*

නමුත් මීට පෙර එනම් 2016.05.30 දින බලපත්‍රයේ කාලය දීර්ඝ කිරීමට ඉඩකඩ තිබූ නමුත් නාගරික කොමසාරිස්වරිය හිතාමතාම තමාට වසරකට දියයුතු අනුමැතිය මාස 04 දින 04 කට සීමා කළ බවත් නැවත තමා 2017.02.10 දින ඉදිකිරීම් කටයුතු කිරීමට යාමේදී මහනුවර නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ නියෝග පරිදි යැයි කියමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිකිරීම් නවතන ලෙස දැන්වූ බවත් නමුත් තමාට ඒ සම්බන්ධයෙන් කිසිදු ලිඛිත දැනුම්දීමක් කර නොමැති බවත් ඒ අනුව නාගරික කොමසාරිස්වරයා විසින් හිතාමතාම සැලසුම් සහගතව ක්‍රියාකරන බවත් මහනුවර නගර සභාවේ මෙම ක්‍රියාකලාපය නිසා තමාගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත් දක්වා ඇති අතර. මේ පිළිබඳව කරුණු සලකා බලා බලපත්‍රයේ අනුමත කාලය මුදල් ගෙවූ දින සිට වසරක කාලයකට දීර්ඝ කරදෙන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින බවට සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-

මෙම පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවීය නියෝජ්‍ය නාගරික කොමසාරිස්වරයා වෙතින් කොමිෂන් සභාව විසින් වාර්තාවක් කැඳවා ඇති අතර එම වාර්තාවෙන් දක්වා ඇත්තේ. පැමිණිලිකාර එම්.ජී. සරත් යන අය විසින් අංක 79/58 ඒ දරණ ස්ථානයේ මාර්ගය දෙසට මායිම් වන කොටස සඳහා මායිම් බැම්මක් හා ගේට්ටුවක් ඉදිකිරීම සඳහා බීඒ/51/2013 යටතේ සැළැස්මක් ඉදිරිපත් කරන ලද අතර එම සැලැස්ම නාගරික සැලසුම් කමිටුව විසින් නිර්වන්දි ගිවිසුමකට යටත්ව අනුමත කරන ලද බවත් ඒ සඳහා අංක 238 හා 2014.05.30 දිනැති සංවර්ධන බලපත්‍රය නිකුත් කළ බවත්ය.

ඉන් අනතුරුව පැමිණිලිකරු විසින් නැවත බීඒ/494/2015 යටතේ එකී ඉඩමේ උතුරු හා නැගෙනහිර මායිම් දෙසට මායිම් වන බැම්මක් හා මාර්ගයට මායිම් වන කොටසක් සඳහා මායිම් බැම්මක් සඳහා නැවත සැලැස්මක් ඉදිරිපත් කළ බවත්. ඒ වන විට නාගරික සැලසුම් කමිටුව විසින් මාර්ගයට ආසන්නව බැම්මක් ඉදිකරන්නේ නම් එය මාර්ගය මායිමේ සිට අඩි 03 ක් දුරින් ඉදිකළ යුතු බවට 2015.08.11 දින පොදු සැලසුම් කමිටු තීරණයක් ගත් බවත් මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් දින රහිතව අභියාචනයක් ඉදිරිපත් කරමින් මාර්ගය දෙසට වන බැම්ම සඳහා මීට පෙර සැලැස්මක් අනුමත කරගෙන ඇති බවත් වැරදීමකින් මෙම සැලැස්ම සඳහා එකී කොටස ඇතුළත්ව ඇති බව දන්වා ඇති බවත් සඳහන් කර ඇත.

ඒ අනුව අභියාචනය සලකා බැලූ නාගරික සැලසුම් කමිටුව විසින් පෙර කමිටු තීරණයම ක්‍රියාත්මක කළ යුතු බවට තීරණයක් ගත් බවත් පොදු ප්‍රවේශ මාර්ග අවහිර වන සේ මායිම් බැම්මක් බැඳීමට විරුද්ධව ප්‍රදේශවාසීන්ගෙන් ලද පැමිණිලි අනුව අදාළ ස්ථානය පරීක්ෂා කර මායිම් බැම්ම අඩි 03 ක් පසුපසට වන සේ සැලසුම් සංශෝධනය කළ යුතු බවට සැලසුම් කමිටුව තීරණය කර ඒ බව 2016.05.28 දිනැතිව පැමිණිලිකරු දැනුවත් කර ඇති බවත් සඳහන් කර ඇත.

අදාළ ඉදිකිරීම් සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් පවතින අතරතුර 2016.05.16 දිනැති ලිපියෙන් පැමිණිලිකරු බීඒ/51/2013 අනුමත සැලැස්මෙහි වලංගු කාලය දීර්ඝ කරදෙන ලෙස ඉල්ලා සිටි බවත් යම්කිසි ඉදිකිරීමක් සඳහා නිකුත් කරනු ලබන සංවර්න බලපත්‍රයේ අංක 01 කොන්දේසිය තුල

අවසරපත්‍රයේ වලංගු කාලය තුළ අදාළ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත්නම් හා සංවර්ධන කටයුතු අවසාන නොමැති නම් අවසර පත්‍රයේ වලංගු කාලය තවත් වසර දෙකක් දීර්ඝ කිරීම සලකා බැලිය හැකි බවත් නමුත් 2017.01.24 දින ස්ථාන පරීක්ෂණය කරන විටද පැමිණිලිකරු 2014.05.30 දින අනුමත සැලැස්මට අනුව ඉදිකිරීම් ආරම්භ කර නොතිබූ බවත් දක්වා ඇත.

එසේ තිබියදීත් අදාළ ස්ථානයේ බැම්ම ඉදිකිරීම සඳහා ඔහු විසින් නැවතත් 2015 වර්ෂයේ සැලැස්මක් ඉදිරිපත් කර තිබියදී 2017.01.24 දින පැවැති නාගරික සැලසුම් කමිටුව විසින් බීජ්/51/2013 යටතේ අනුමත සැලැස්මෙහි වලංගු කාලය දීර්ඝ කිරීමට කටයුතු කර ඇති බවත්. අනුමත සැලැස්මක වලංගු කාලය එම සැලැස්ම අනුමත කළ දින සිට උපරිම වර්ෂ 3කට පමණ සීමා වන බැවින් ඉහත සැලැස්මෙහි වලංගු කාලය ඒ වන විට වර්ෂ 02 ඉක්මවා ඇති බැවින් 2017.01.24 දින සැලසුම් කමිටුව විසින් සැලැස්මේ අනුමත කාලය 2016.05.30 දින සිට අවසන් වරට ඉදිරියට වර්ෂයක කාලයකට දීර්ඝ කිරීමට තීරණය කර ඇති බවත්ය.

මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන හා පරීක්ෂණ කටයුතු වලදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරුගේ ගොඩනැගිලි අයදුම්පත් අංක බීජ්/51/2013 හා 2014.05.30 දින සිට වසරින් වසර දීර්ඝ කර තිබෙන නමුත් පැමිණිලිකරුට අදාළ ඉදිකිරීමට වෙනත් පාර්ශවයන් විසින් බාධා කිරීම හේතුවෙන් අදාළ ඉදිකිරීම් කටයුතු සිදුකර ගැනීමට නොහැකි වී ඇත.

2016.05.30 දින සිට වසරක කාලයක් සඳහා අදාළ සංවර්ධන බලපත්‍රය දීර්ඝ කරදෙන ලෙස පැමිණිලිකාර පාර්ශවය 2016.05.17 දිනැතිව නාගරික කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇති නමුත් අදාළ දීර්ඝ කිරීමේ අත්සන තබා ඇත්තේ 2017.01.26 දින වේ. ඒ අනුව 2017.05.30 දිනෙන් වසරක කාල සීමාව අවසන් වන බැවින් පැමිණිලිකරුට ඒ සඳහා ඉතිරිව ඇත්තේ මාස 04 ක කාල සීමාවක් වන බව අනාවරණය වී ඇත.

2017.01.26 දින ලබා දී ඇති දීර්ඝ කිරීම අනුව පැමිණිලිකරු ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමෙන් පසු නාගරික කොමසාරිස්ගේ නියෝගයක් යැයි දන්වා මහජන සෞඛ්‍ය පරීක්ෂක දර්ශන අබේසිංහ මහතා විසින් වාචිකව කරන ලද දැනුම්දීමක් අනුව ඉදිකිරීම් අත්හිටුවා ඇති අතර ඒ පිළිබඳ පොලීසියේද පැමිණිලි කර විභාගයක් පවත්වා ඇත.

ඒ අනුව අනාවරණය වී ඇත්තේ. පැමිණිලිකරුට අදාළ ඉදිකිරීම සඳහා නිකුත් කර ඇති බීජ්/51/2013 සංවර්ධන බලපත්‍රයේ කාලසීමාව වසරින් වසර 03 වරක් දීර්ඝ කළද පැමිණිලිකරුට වරින් වර සිදුකර ඇති බාධා කිරීමේ හේතුවෙන් අදාළ කාර්යය කරගැනීමට නොහැකි වී ඇති බැවින් සංවර්ධන බලපත්‍රය තවදුරටත් දීර්ඝ නොවීම හේතුවෙන් අගතියක් සිදුවී ඇති බවයි.

තවද පැමිණිලිකරුගේ නිවසට ඉහළින් තබෙන නිවසේ අපජලය බැහැරව යන බටය පැමිණිලිකරුගේ නිවස දෙසට හරවා ඇති බැවින් වැසිජලය නිවස තුළට ගයාඑන බවත් එබැවින් අදාළ බටය ඉවත්

කරදෙන ලෙස පැමිණිලිකරු විසින් ඉල්ලීම් කර ඇති නමුත් එම කාර්යය ඉටුකරදීමට නගර සභාව ක්‍රියාකර නොමැති බවත් තහවුරු වේ.

නිගමනය :-

පැමිණිලිකරුට නිකුත් කර ඇති සංවර්ධන බලපත්‍රය අනුව නියමිත කාල සීමාව තුළ අදාළ සංවර්ධන කටයුතු කිරීමේදී වගඋත්තර පාර්ශවය මඟින්ම බාධා ඇති කිරීම හේතුවෙන් එය සිදුකිරීම නොහැකි වීම මත සංවර්ධන බලපත්‍රයේ කාලය දීර්ඝ කර දිය යුතු වුවත් එය ඉටුකර නොදීම මඟින් පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාවෙන් සහතික කර දී ඇති නීතිය ඉදිරියේ සමාන ලෙස සැලකිලි ලැබීමට ඇති මූලික අයිතිවාසිකම වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරන ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකරුගේ සංවර්ධන බලපත්‍රයේ කාල සීමාව දීර්ඝ කර දීමට අවශ්‍ය පියවර ගත යුතුය.

2018.05.01 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/